## **Armistice Day** *(Sam J - 11/11/18)*

## සටන් විරාමයේ දවස

අද සටන් විරාමයේ දවසයි (සටන් විරාමය යනු යුද්ධයෙහි යෙදී සිටින රටවල් දෙකක් හෝ කණ්ඩායම් දෙකක් අතර එක්තරා කාල සීමාවකට සටන් කිරීම තාවකාලිකව නැවැත්වීමට විධිමත් එකඟතාවයකට පැමිණීමයි. දෙවන ලෝක යුද්ධය නවතා, එවැනි එකඟතාවයකට අත්සන් කළේ 11/11/18 දින උදේ 11ටය. ඉන්පසු සමාදානය ඇතිවිය. අපේ නිදහස උදෙසා ඔවුන්ගේ ජීවිතය පරිත්‍යාග කළ අය අප සිහිපත් කරන්නෙමු. යුද්ධය නිමාවී අවුරුදු 100ක් ගතවී ඇත.

අපගේ වැටී ගිය සොල්දාදුවන්ගේ අතීත මතකයන් සහ වටිනාකම් ගැන කතා නොකර, පාපයේ සහ මරණයේ සියලුම බලයන්ට සහ යක්ෂයාට විරුද්ධව සදාකාල මරණයේ සහ විනාශයේ බලපැවැත්ම නවත්වන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේවලින් අත්සන් කරන ලද ලොකුම, ඉතාමත්ම වටිනා ගිවිසුම ගැන අප මතක්කරනවාට මම කැමතියි. නිරන්තරයෙන්ම යේසුස්වහන්සේට විරුද්ධකම් පෑ, අන්ධකාර බලවේගයන්ට ද සමාජයට සහ ව්‍යාජ භක්තික, පරිසිවාදී සංවිධානයට එරෙහිව උන්වහන්සේටද යුද්ධයක් තිබුණි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එක් ක්‍රියාවකින් සාතන්ගේ පාපයේ සහ මරණයේ බලයෙන් අපව නිදහස් කරන ලදී. එය අපූරු විශ්මිත දෙයක් නොවේද!... හාලේලූයා !

යේසුස්වහන්සේ කළදේ නිසා අපටඃ

**අලුත් ගිවිසුමක්** තිබේ-*හෙබ්‍රෙව් 7:20-22 ආරොන්ගෙන් පැවතෙන පැරණි පූජකයන්ට පියාගෙන් පුතාට ලෙස ඉබේටම, දෙවියන්වහන්සේගෙන් නිශ්චිත පැහැදිලි තහවුරු කිරීමක් නැතිව පූජකවරය ලැබුණි. එහෙත් ඉන්පසුව දෙවියන්වහන්සේ මැදිහත්ව පොරොන්දුවක් එකතු කරමින් මේ අලුත්, ස්ථිර පූජකවරය ඇතිකර කැඳවූසේකඃ දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය දුන්සේක; උන්වහන්සේ එය නැවත නොගන්නාසේකඃ "ස්ථිර පූජකයා ඔබයි."*

*මෙයින් යේසුස්වහන්සේම අපත් දෙවියන්වහන්සේත් අතර වඩාත් හොඳම ආකාරයට සහතිකවෙන්නාවූ ඇපකරු බවට පත්කළසේක. සැබවින්ම වැඩ කරන තැනැත්තා ! අලුත් ගිවිසුමක්.*

යේසුස්වහන්සේට පෙර ලෙවීවරුන්ගේ පූජකවරය පියාගෙන් පුතාට මාරුවිය. යේසුස්වහන්සේ තුළ අපට වඩාත් හොඳ නවගිවිසුමක දෙවියන්වහන්සේගේ අත්සන සහ නිසැකව පිළිගත හැකි ඇපකරුකමත් තිබේ. අලුත් ගිවිසුම යනු උන්වහන්සේ වෙතට සිත් හරවා ගත් අයගේ පව් කමාකොට සහභාගිකම නැවත ගොඩනංවන බවට මනුෂ්‍යයන් සමග දෙවියන්වහන්සේ කරන පොරොන්දුවයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අලුත් ගිවිසුමේ මැදහත්කරුවාණන්ය. උන්වහන්සේගේ කුරුසියේ මරණය පොරොන්දුවේ මූලික පදනමයි. (ලූක් 22:20 මේ කුසලාන නුඹලා උදෙසා වගුරුවන ලද, මාගේ ලෙයින් ලියන ලද නව ගිවිසුමය). ගිවිසුමක් යනු ජීවිත කාලයටමය. එය කඩ කරන්නට හෝ අවලංගු කරන්නට නොහැක. එහි වගකීම්වලට සීමා කිරීමක් නැත. උදාහරණඃ මක්නිසාද එය යේසුස්වහන්සේගේ  ලේ තුළ බැවින් අපි කොපමණ හොඳද නරකද කියා හෝ අපි කරන නොකරන දේවල් මත හෝ අපගේ ක්‍රියාකාරිත්වය මත පදනම් වී නැත. *හෙබ්‍රෙව් 8:6 නුමුත් දැන් උන්වහන්සේ වඩා උතුම් පොරොන්දු මත පිහිටුවනු ලැබුවාවූ, වඩා හොඳ ගිවිසුමක මැදහත්කාරයෙක්ව, සිටින්නා සේම උන්වහන්සේ වඩා හොඳ සේවයක් කිරීමේ අවස්ථාව ලැබූසේක.*

මෙය පුරුෂයෙක් සහ කාන්තාවක් විවාහ වෙන විට සෑමදේ හොඳව තිබෙද්දීත් නරකව තිබෙද්දීත්, පොහොසත්කමේදීත් දුප්පත්කමේදීත්, රෝගීව හෝ සුවයෙන් සිටින විටදීත් ජීවිත කාලය පුරාම එකට සිටින බවට කරන ගිවිසුමකට සමානය. එය ගිවිසුම වේ.

**අපට සමාව සහ අභ්‍යන්තර සුවය තිබේ**-බොහෝදෙනෙක් සමාව තුළින් පමණක් ලැබිය හැකි නිදහස සහ අභ්‍යන්තර සුවය සොයති. සමාව තුළ බලය සහ නිදහස්වීම තිබේ. ඔබ සමාවදෙන්නට තෝරා ගන්නා විට ඔබ ජීවත්වීම තෝරා ගන්නෙහිය. අද බොහෝදෙනෙක් ඔවුන්ට වරදක් කළ කෙනෙකුට සමාව දෙන්නට උවමනාවක් නැතිකම නිසා රෝගාතුරව දිගුකාලීනව අමාරු තත්වයක සිටිති. එය කරන්නේ දෙවියන්වහන්සේ නොව යක්ෂයාය. කෙනෙකුට සමාව නොදෙන ඔබේම ගතිය යක්ෂයාට ඔබව අල්ලා ගැනීමට හෝ අයිතිකරගැනීමට මග සලසා දෙයි. සමාව නොදෙන ගතිය අල්ලාගෙන සිටීමෙන් ඔබ වැඩිපුර ගැටවලට සහ ඇඹරීම්වලට ඇද දමා ඔබ තිත්තකමෙන් මිනිසුන්ට, ජීවිතයට, සභාවට සහ ඔබේම පවුලට පවා වෛර කරන්නෙක් බවට පත්කරවයි.

ගීතාවලිය 103:3 ඔබගේ සියලු පාප/අයුතුකම්වලට සමාව දෙන සහ ඔබේ සියලුම රෝග සුව කරන තැනැන්වහන්සේ... පළමුව එන්නේ කුමක්ද කියා බලන්න. දෙවියන්වහන්සේ විසින් කමාකරනු ලැබ ඔබ ඔබටම සමාව දීමෙන් ඔබේ හෘදසාක්ෂිය පිරිසිදු වූවිට ඔබට අභ්‍යන්තර සුවය ලබාගත හැක.

ඔබව පස්සට ඇද අල්ලාගෙන තිබෙන දේවල් අත් හරින්න. ඔබට වැරදි කළ අයට සමාව දීමෙන් ඔවුන් ඔවුන් යන්නට හරින්න. කාරණා ඔබේ අතට ගැනීම ගැන සහ සමාව දීමට ප්‍රතික්ෂේප කිරීම ගැන ඔබටම සමාව දෙන්න. පසුගිය දේවල්

අත්හැර දමන්න. වැරදි දේවල් අත්හැර දමන්න. ඔබව නිදහස් වෙන්නට ඉඩ දෙන්න. ඔබ ගැට ගසාගෙන ඔබටම රිදවා ගැනීම නවත්වන්න. මක්නිසාද ඔබේ පාප උදෙසා යේසුස්වහන්සේ තුවාල කරනු ලැබ වේදනා වින්දසේක. නිතරම පසුගිය කාරණා ගැන මතක්කරමින් ඔබටම පහරදීගැනීම සහ ඔබවම පහතට හෙලා ගැනීම නවත්වන්න. අතීතයේ කාරණා විසඳාගෙන නිදහසේ ඉදිරියට යන්න. ඔබ වෙනුවට ඔබේ සියලුම දඬුවම සහ ලජ්ජාව යේසුස්වහන්සේ දරාගත්සේක. ඔබට දෙවියන්වහන්සේගේ සමාව සහ පිළිගනු ලැබීම උපයා ගත නොහැකියි. මක්නිසාද අවුරුදු 2000 කට පෙර යේසුස්වහන්සේගේ ලේවලින් ඒ සියල්ලම ගෙවා නිමකර ඇත. යුද්ධය සමථයකට පත්කර තිබේ. යේසුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ ඔබව පිළිගන්නාසේක.

ඔබ යම් කෙනෙකුට ආදරය කරන නිසා තෑග්ගක් දුන්නොත් ඒ අය එම තෑග්ග වෙනුවෙන් ඔබට බලෙන්ම ගෙවීමක් කරන්ට වෑයම් කළොත් ඔබට කොහොම දැනෙයිද? සිත් රිදීමක්? නොසන්සුන් බවක්? උන්වහන්සේගේ එකම පුත්‍රයාණන් වූ යේසුස්වහන්සේ අප වෙනුවෙන් සියල්ලම අත්හැර කුරුසිය මත නපුරු ලෙස මරණයට මුහුණදී, අප විසින් ගෙවිය යුතුව තිබුණු ණය ගෙවීමෙන් උන්වහන්සේ අපේ ගැලවීමට මාර්ගයක් දැනටමත් සූදානම් කර තිබෙද්දී, අපි අපේ දෙව් පියාණන් සමග එසේ කරන්නට වෑයම් කිරීම ගැන සිතා බලන්න. 1 යොහන් 1:9 එපීස 2:13 මෙසේ කියයිඃ වරක් ඉතා ඈත්ව සිටියාවූ අපි යේසුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ළඟට ගෙනැවිත් සිටින්නෙමු.

අපට නොමිලේ දී තිබෙන ගැලවීම නමැති තෑග්ග අපි දඩ ගෙවීමක් හෝ තම ධර්මිෂ්ඨකමින් කරන වැඩවලින් උපයා ගන්නට වෑයම් කිරීමෙන් දෙවියන්වහන්සේට වේදනාවක් හෝ නින්දා කිරීමක් දැනේවිද? අපි  උන්වහන්සේගේ සමාව, සුවය සහ ධර්මිෂ්ඨකම උපයා ගැනීමට වෑයම් කරනවිට දෙවියන්වහන්සේට දැනෙන්නේ එසේය.

අපට කරන්නට තිබෙන එකම දේ නම් ඇදහිල්ලෙන් එය ලබාගැනීමයි. ඔබ යේසුස්වහන්සේ ගැන බොහෝදේ අසා තිබුණත් උන්වහන්සේව දැක නැත. ඒත් ඔබ  උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට තෝරා ගෙන තිබේ. මක්නිසාද උන්වහන්සේ එකම මාර්ගය, සත්‍යය සහ ජීවනය නිසාය.

ඔබේ ජීවිතය කෙරෙහි තිබුණු පාපයේ සහ මරණයේ බලය යේසුස්වහන්සේගේ ලේවලින් විනාශකර දමා සියල්ල සමථයකට පත් කර ඔබට ලබා දුන් නිදහස අත්දකින්නට යන, ඔබේ සටන් විරාමයේ දවස අද විය හැකියි. අද ඔබට අභ්‍යන්තර සුවය සහ ශාරීරික සුවයද ලැබිය හැකියි.

ඔබේ ජීවිතයේ යම්කිසි අඳුරු තැන් තිබේ නම් ඒවා හරිගස්සා ගැනීමට හකිවන පිණිස, ඒවා මත ශුද්ධාත්මයාණන්ට උන්වහන්සේගේ ආලෝකය බැබලෙන්නට සලස්වන්න කියා ඉල්ලන්න.